# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1133/9 – 2000 මැයි 23 වැනි අඟහරුවාදා – 2000.05.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.-බී. 21/78 iv

### 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමග කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2000 මැයි මස 08 වන දින,
කොළඹ දී ය.

නියමාවලිය

1 .මේ නියමාවලිය 2000 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2000 ජුනි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. 1996 මැයි මස 9 වන දින අංක 922/9 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලැබූ 1996 අංක 11 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලියෙන් අවසන් වරට සංශෝධිත, 1980 අප්‍රේල් මස 10 දින අංක 83/7 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලැබූ 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ -

(1) එහි 13 වන ඡේදයෙහි (ට) අනුඡේදයේ "විකිරණ චිකිත්සාව හා නියෝප්ලාස්මවේදය" යන වචන ඉවත්කොට, ඒ වෙනුවට "සායනික නියෝප්ලාස්මවේදය" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි 14 වන ඡේදයෙහි -

(i) (1) සහ (2) වන අනුඡේද ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන්, : -

"(1) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල එකක හෝ ඊට වැඩි ගණනක අධ්‍යයන අංශයක් පිහිටුවා ඇත්තා වූ විශේෂ ක්ෂේත්‍රයක් වෙනුවෙන් අධ්‍යයන සභාවක් පිහිටුවා ඇති අවස්ථාවක, ඒ අධ්‍යයන සභාව, (3) වන ඡේදයේ විධිවිධාන වලට යටත්ව, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය :-

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) පනත යටතේ පිහිටුවා ඇති විශ්ව විද්‍යාලවල එක් එක් වෛද්‍ය හෝ වෛද්‍ය විද්‍යා පීඨයක අධ්‍යයන අංශයේ ප්‍රධානියන් හෝ ඔවුන්ගේ නාමිකයන් ;

(ඇ)(i) ක්ෂුද්‍ර ජෛවී විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය හැර, පනත යටතේ පිහිටුවා ඇති විශ්ව විද්‍යාලවල වෛද්‍ය හෝ වෛද්‍ය විද්‍යා පීඨයන්හි ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන්,සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයන් අතුරෙන් තෝරා පත්කර ගනු ලබන සාමාජිකයන් තිදෙනෙක් ;

(ii) ක්ෂුද්‍ර ජෛවී විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය වෙනුවෙන් මෙම පනත යටතේ පිහිටුවා ඇති විශ්ව විද්‍යාල වල වෛද්‍ය හෝ වෛද්‍ය විද්‍යා පීඨයන්හි පරපෝෂවේද අංශයන්හි ප්‍රධානීන් අතුරෙන් තිදෙනෙක්;

(iii) ප්‍රජා වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය වෙනුවෙන් පනත යටතේ පිහිටුවා ඇති විශ්ව විද්‍යාලවල එක් එක් දන්ත ශල්‍ය විද්‍යා පීඨයන්හි ප්‍රජා දන්ත සෞඛ්‍ය අධ්‍යයන අංශයේ ප්‍රජා දන්ත වෛද්‍ය අංශයේ ප්‍රධානීන්.

(ඇ) (i) ප්‍රජා වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍ර හැර, පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තිය-

(අ) ප්‍රධාන අභ්‍යාස මධ්‍යස්ථානයෙන් නියෝජිතයන් තිදෙනෙක් ;

(ආ) පහත දැක්වෙන එක් එක් අභ්‍යාස මධ්‍යස්ථානවලින් එක් නියෝජිතයා බැගින්, :-

දකුණු කොළඹ ශික්ෂණ රෝහල ;
උතුරු කොළඹ ශික්ෂණ රෝහල ;
ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල ;
මහනුවර ශික්ෂණ රෝහල ;
ගාල්ල ශික්ෂණ රෝහල ;
යාපනය ශික්ෂණ රෝහල ;

(ii) ක්ෂුද්‍ර ජෛවී විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය වෙනුවෙන්, (1) වන අනුඡේදය යටතේ වූ නියෝජිතයන්ට අමතරව, ශ්‍රී ලංකා ජාතික රෝහලෙන් එක් අතිරේක නියෝජිතයෙක් ;

(iii) ප්‍රජා වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රය වෙනුවෙන්, අවම වශයෙන් පහත සඳහන් එක් මධ්‍යස්ථානයකින් එක් නියෝජිතයකු බැගින්, අභ්‍යාස මධ්‍යස්ථානවලින් නියෝජිතයන් දහ දෙනෙක් ;

පවුල් සෞඛ්‍ය කාර්යාංශය ;
කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනය ;
මැලේරියා මර්දන ව්‍යාපාරය ;
වසංගත රෝග විද්‍යා ඒකකය ;
ලිංගික සබඳතා මගින් පැතිරෙන රෝග/ඒඩ්ස් පාලන වැඩ සටහන.

(iv) පවුල් වෛද්‍ය විද්‍යා සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තීය විශේෂඥ ක්ෂේත්‍රය වෙනුවෙන්, අධ්‍යයන සභාව විසින් අභ්‍යාස ඒකකවලින් නම් කරනු ලබන නියෝජිතයන් නව දෙනෙක් ;

(ඉ) පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තිය හැර පහත දැක්වෙන අදාළ වෘත්තීය ආයතනයෙන් සාමාජිකයන් දෙදෙනෙක් ; එයින් -

(i) එක් නියෝජිතයකු සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් විය යුතු ය ; තව ද
(ii) එක් නියෝජිතයකු පනත යටතේ පිහිටුවා ඇති විශ්ව විද්‍යාලවල කාර්ය මණ්ඩල වලින් විය යුතුය.

(2) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයක් මගින් අධ්‍යයන අංශයක් පිහිටුවා නොමැති විශේෂඥ ක්ෂේත්‍රයක් වෙනුවෙන් යම් අධ්‍යයන සභාවක් පිහිටුවා ඇති අවස්ථාවක, ඒ අධ්‍යයන සභාව 3 වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුත්තේ ය :-

(අ) අධ්‍යක්ෂවරයා ;
(ආ) මේ පනත යටතේ පිහිටුවා ඇති විශ්ව විද්‍යාවල එක් එක් වෛද්‍ය හෝ වෛද්‍ය විද්‍යා පීඨයන්හි ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරෙන් තෝරා පත් කර ගනු ලබන එක් සාමාජිකයෙක් ;
(ඇ)(I) විකිරණවේදය, ව්‍යාධිවේදය, සායනික නියෝප්ලාස්මවේදය සහ වෛද්‍ය පරිපාලනය යන විශේෂඥ ක්ෂේත්‍රයන්හි හැර,

(අ) ප්‍රධාන අභ්‍යාස මධ්‍යස්ථානයෙන් නියෝජිතයන් තිදෙනෙක් ;
(ආ) පහත දැක්වෙන එක් එක් අභ්‍යාස මධ්‍යස්ථානයෙන් එක් නියෝජිතයා බැගින් ; එනම් -

දකුණු කොළඹ ශික්ෂණ රෝහල ;
උතුරු කොළඹ ශික්ෂණ රෝහල ;
ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල ;
මහනුවර ශික්ෂණ රෝහල ;
ගාල්ල ශික්ෂණ රෝහල ;
යාපනය ශික්ෂණ රෝහල

(ii) විකිරණවේද විශේෂඥ ක්ෂේත්‍රය වෙනුවෙන්, (1) වන අනුඡේදය යටතේ වූ නියෝජිතයන්ට අමතරව, රිජ්වේ ආර්යා ළමා රෝහලෙන් අතිරේක නියෝජිතයෙක්,

(iii) සායනික නියෝප්ලාස්මවේදය විශේෂඥ ක්ෂේත්‍රය වෙනුවෙන්, ප්‍රධාන අභ්‍යාස මධ්‍යස්ථානයෙන් සහ මහරගම පිළිකා ආයතනයෙන් අවම වශයෙන් තිදෙනකු සහිතව, (i) වන අනුජේදයේ සඳහන් අභ්‍යාස මධ්‍යස්ථානවලින් නියෝජිතයන් නව දෙනෙක් ;

(iv) වෛද්‍ය පරිපාලනය විශේෂඥ ක්ෂේත්‍රය වෙනුවෙන් අභ්‍යාස මධ්‍යස්ථානවලින් අධ්‍යයන සභාව විසින් නම් කරනු ලබන නියෝජිතයන් නව දෙනෙක් ”

(II) එහි (2) වන අනුජේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

“(3) (1) වන සහ (2) වන ඡේදවල සඳහන් අධ්‍යයන සභාවේ සියලුම සාමාජිකයන් පුහුණුකරුවන් විය යුතු අතර, පවුල් වෛද්‍ය සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තිය යන විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් හැර, පුහුණුකරුවකු, මණ්ඩලය විසින් සහතික කරනු ලැබීමෙන් පසු හෝ මණ්ඩලය විසින් සහතික කරනු ලැබීම සඳහා වූ වරප්‍රසාදවලට සුදුසුකම් ලැබීමෙන් පසු හෝ පාර සායනික වෛද්‍ය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වන විට එම්. ඩී. උපාධිය හෝ අදාළ ක්ෂේත්‍රයේ ඒ හා සමාන සුදුසුකම් හෝ ලබා ගැනීමෙන් පසු අවුරුදු පහක පළපුරුද්ද හෝ, අදාළ ක්ෂේත්‍රයේ පුහුණුකරුවකු වශයෙන් අවුරුදු තුනක පළපුරුද්ද හෝ ලබාගත් තැනැත්තකු විය යුතු ය :

එසේ වුවද, (1) (ඇ) ඡේදයේ සහ (2) (ඇ) ඡේදයෙහි හෝ සඳහන් පුහුණු මධ්‍යස්ථාන නියෝජනය කරන නියෝජිතයන්, අවස්ථාවෝචිත පරිදි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ විශේෂඥ ක්ෂේත්‍රයේ පුහුණු මධ්‍යස්ථානවල නියුතු පුහුණුකරුවන් විසින් තෝරා ගනු ලැබිය යුතු ය. තෝරා ගනු ලැබූ තැනැත්තන්ගේ නම් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ අධ්‍යක්ෂවරයා විසින්, අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3අ) දන්ත ශල්‍යවේදය විශේෂඥ ක්ෂේත්‍රය වෙනුවෙන් අධ්‍යයන සභාවක් පිහිටුවා ඇති අවස්ථාවක ඒ සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) පහත සඳහන් එක් එක් වෛද්‍ය ක්ෂේත්‍රවල ප්‍රධානියා හෝ ඔහුගේ නාමිකයා :-

මුඛ ශල්‍ය ;
මුඛ වෛද්‍ය ;
මුඛ ව්‍යාධිවේදය ;
පිළිසකර දන්ත වේදය ;
ප්‍රශ්ලේෂක දන්ත වේදය ;
ප්‍රජා දන්ත සෞඛ්‍යය ;
දන්ත සෘජුකරණය ;
ළමා දන්තවේදය ;
දන්ත ව්‍යුහවේදය ;
මූලික විද්‍යාවන් ;

(ඇ) අදාළ වෘත්තිය මණ්ඩලයෙන් සාමාජිකයන් දහ දෙනෙක් ; ඔවුන් අතුරෙන් අවම වශයෙන් -

(i) සාමාජිකයන් තිදෙනකු ප්‍රධාන අභ්‍යාස මධ්‍යස්ථානයෙන් විය යුතුය ;

(ii) එක් සාමාජිකයකු මහරගම පිළිකා ආයතනයෙන් විය යුතුය ;

(iii) එක් සාමාජිකයකු මහනුවර, මහ රෝහලෙන් විය යුතු ය ;

එසේ වුවද, විශ්ව විද්‍යාලයක් හෝ අභ්‍යාස මධ්‍යස්ථානයක් නියෝජනය කරන සාමාජිකයන් තමන් අධ්‍යයන සභාවේ සාමාජිකත්වය දරන්නේ යම් ධූරයක් ප්‍රකාරව ද, ඒ ධූරය තමන් දරන තාක් කල් ධූර දැරිය යුතු ය.

(3) එහි 25 වන ඡේදයෙහි - “වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය” යන්නෙහි අර්ථ කථනයෙහි

“විකිරණ චිකිත්සාව ” හා “නියෝප්ලාස්මවේදය” යන වචන වෙනුවට සායනික “නියෝප්ලාස්මවේදය” යන වචන ආදේශ කිරීමෙන්.

3. මේ නියමාවලියෙහි -

“පනත ” යන්නෙන්, 1985 අංක 7, 1988 අංක 24, 1988 අංක 26, 1988 අංක 33, 1989 අංක 3 හා 1995 අංක 1 දරන විශ්ව විද්‍යාල (සංශෝධන) පනත් මගින් සංශෝධිත 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත අදහස් වේ.

06-186

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.